ශීර්ෂය - 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 217 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන ලද ඒ.සී.ඒ - 6 (එස්ඒ82) ප්‍රකාශය අනුව මූල්‍ය නොවන වත්කම් වල ආරම්භක ශේෂය රු.මිලියන 84.19 ක් වූ අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම් වල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය රු.මිලියන 83.41ක් වී තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම්හි ආරම්භක ශේෂයේ රු.මිලියන 0.78 ක වෙනසක් විය.	භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද එස්ඒ 82 වාර්තාව අනුව මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ තීරුවට නිවැරදිව ආරම්භක ශේෂයන් ස්ථානගත වී නොමැති බව.	දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර වාර්තා සැසඳීම් කර දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 8.1 වගන්තිය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ සකසා ඇති ස්ථාවර වත්කම් පිළිබඳ මොඩියුලයක් විගණනයට ඉදිරිපත් නොකළ අතර , ඉදිරිපත් කරන ලද ස්ථාවර වත්කම් ලැයිස්තුවේ සඳහන් වාහන වටිනාකම හා දෙපාර්තමේන්තුව සතු වාහන පිළිබඳව සකස් කරනු ලබන වියදම් වාර්තාවේ සඳහන් වාහන වල වටිනාකම් අතර එකතුව රු.මිලියන 7.87 ක් වූ වෙනස්කම් පැවතුණි.	ස්ථාවර වත්කම් ඇතුළත් මෘදු පිටපතක් විද්‍යුත් තැපැල මගින් 2025 අප්‍රේල් 21 දින යොමු කිරීමට කටයුතු කළ අතර මූල්‍ය ප්‍රකාශනවල වසර ගණනක් පුරා පෙන්වා ඇත්තේ එම ලැයිස්තුවට අදාල වටිනාකම බව නිරීක්ෂණය වේ. එම වෙනස පිළිබඳව සොයා බලා නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	නිවැරදි වටිනාකම ගිණුම් ගත විය යුතුය. රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව ස්ථාවර වත්කම් පිළිබඳ මොඩියුලයක් සකස් කර ස්ථාවර වත්කම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් නිසි පුරෝකථනයකින් හෝ කිසිදු තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයයන් 12 ක් සඳහා සලසා ගෙන තිබූ ප්‍රතිපාදන වලින් සියයට 45 ත් සියයට 100 ත් අතර පරාසයක් තුල ඉතිරිවීම් සිදුවී තිබුණි. එමෙන්ම වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන මු.රෙ 66 මගින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කර තිබුණද සියයට 37 සිට සියයට 95 දක්වා එම වැය විෂයයන්ගේ ඉතිරිවීම් තිබුණි. තවද අංක 217-1-1-1403 දරන වැය විෂයයේ ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.මිලියන 1.2 ක් වී තිබුණු අතර මුදල් රෙගුලාසි 66 මගින් රු.මිලියන 1.5 ක් මාරු කර ගැනීම නිසා ඇස්තමේන්තු ප්‍රතිපාදනය ඉක්මවා මාරුකිරීම් සිදුකර තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 හි 2 ඡේදය අනුව රාජ්‍ය වියදම් සීමා කිරීම සඳහා Zoom තාක්ෂණය හරහා සාකච්ඡා හා රැස්වීම් පැවැත්වීම, කොමසාරිස් විසින් නිල වාහන දීමනාව ලබා ගැනීම, කොමසාරිස් රාජකාරි සඳහා යොදවන රියදුරු සඳහා සංයුක්ත දීමනා ගෙවීමට අවශ්‍ය නොවීම, UNCRC දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ගැටළු පැවතීම, සේවා ගිවිසුම්වලට එළඹීම ප්‍රමාද වීම, මූලධන වත්කම් අළුත්වැඩියාව අවශ්‍ය නොවීම, පුහුණු වැඩසටහන් නොපැවැත්වීම සහ පරත්ත ළමා පුහුණු උපදේශන මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු ප්‍රමාද වීම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු විය. 2024 වර්ෂය ආරම්භයේදී විදුලි බිලෙහි සිදුවූ ඉහල යාම නිසා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා මාරු කිරීම් සිදුකිරීමට සිදු වූ බව.	මුදල් රෙගුලාසි 50(ii) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන් දීමේ නිලධාරී විසින් වගබලා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු ආවරණය කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක අංශය කරනු ලබයි. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තිය සහ 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට වූ ප්‍රකාශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	DMA/01-2019 හි 8 වන ඡේදයේ සඳහන් පරිදි අදාල වාර්තා සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණක වෙත ලබා දී ඇති බව.	

3.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2020 අගෝස්තු 28 දිනැතිව නිකුත් කළ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 09 ඡේදයෙන් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාල කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත් අවස්ථා 03 කදී ලබාගත් රු.මිලියන 0.17ක් වූ අතුරු අග්‍රිම පියවීමට දින 12 සිට දින 15 දක්වා කාලයක් ගත කර තිබුණි.	අත්තිකාරම් පියවීමට ප්‍රමාදයක් සිදුවී ඇති බව පිළිගන්නා අතර ඉදිරියේ දී මෙවැනි තත්වයන් නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) අනුව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛන අනුව දිනෙන් දින වැඩිවන පාසල් හැර ගිය ළමුන් සංඛ්‍යාව, ළමයින් ගණයට අයත් යොවුන් වියේ විවාහ, ළමයින් ගණයට අයත් යොවුන් වියේ ගැබ්ගැනීම්, ළමුන්ට වන ශාරීරික හිරිහැර, මානසික අපයෝජන, ළමා ලිංගික අපයෝජන, ළමයින් නොසලකා හැරීම, ළමා කම්කරුවන්, අන්තර්ජාලය ආශ්‍රිත ළමුන් සම්බන්ධ සිදුවීම් හා ළමුන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවීම යන ගැටළු වලින් පෙළෙන ළමුන් ඉලක්ක කර ගැනීමකින් තොරව දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි.	පාසල් හැරගිය ළමුන් පාසල් ගත කිරීමේ කටයුතු දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර නිළධාරීන් වන ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/ සහකාර නිලධාරින්ගේ රාජකාරි පැවරීම තුළ අන්තර්ගත වේ. ඔවුන් එම කාර්යභාරය සාමාන්‍ය රාජකාරි කටයුත්තක් ලෙස සිදු කරනු ලබයි. පාසල් හැරගිය ළමුන් පාසල්ගත කිරීම සහ පාසල් ගමනට බාධා පමුණුවන අවස්ථා වළක්වාලීමේ අරමුණින් අධ්‍යාපන ආධාර, කැපකරු දෙගුරු ආධාර, හදිසි ආපදා ආධාර ලබාදීම සිදු කරනු ලබයි. එම වැඩසටහන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඇති බව.	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය.

4.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික ප්‍රතිපත්තීන් හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හළ හා අසරණ ළමයින්ද, නීතිමය ගැටළු වලට මුහුණදුන් ළමයින්ද සුවිශේෂී කර ගනිමින් සියළු ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකර දීම පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, බරපතල අවදානමට ලක්වන වීදි දරුවන්, වෙරළ ආශ්‍රිත, වතු ආශ්‍රිත ආන්තික ප්‍රජාවගේ දරුවන් හඳුනාගෙන එම දරුවන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට, එම දරුවන්ගේ අයිතීන් තහවුරු කිරීමට හා එම දරුවන්ගේ අයිතිවාසිකම් කඩවීම වැලැක්වීම සඳහා කිසිදු වැඩපිළිවෙලක් මේ දක්වා සකස් කර ක්‍රියාවට නංවා නොතිබුණි.	සෑම වර්ෂයකම බරපතල අවදානමට ලක් විය හැකි දරුවන් මෙන්ම ආන්තික ප්‍රජාවගේ දරුවන් වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන ව්‍යාපෘති අතරින් සුදුසු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම ද සිදු කරනු ලබයි. මේ වන විට අවදානම් දරුවන් හඳුනා ගැනීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. එසේම තාක්ෂණික පහසුකම් නොමැති වීම හේතුවෙන් බරපතල අවදානමට ලක් වන වීදි දරුවන් , වෙරළ හා වතු ආශ්‍රිත ආන්තික ප්‍රජාවගේ දරුවන් සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ ගැටළු පවතින බව.	ළමා අයිතිවාසිකම් ප්‍රඥාප්තිය ප්‍රකාරව බරපතල අවධානමට ලක්වන වීදි දරුවන්, වෙරළ ආශ්‍රිත දරුවන් හා වතු ආශ්‍රිත ආන්තික ප්‍රජාවගේ දරුවන් ප්‍රමුඛ සෑම දරුවකුගේම අයිතිවාසිකම් තහවුරු කරගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ආඥා පනත් ඇතුළු නීති හා අනපනත් කාලීන අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවද, 2024 අංක 39 දරණ ළමයින් සහ යෞවනයන් පිළිබඳ පනත හා 1941 අංක 24 දරණ දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත කාලීන අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය කර නොතිබුණි.	අධිකරණ අමාත්‍යාංශය මගින් 2024 ජූනි 10 දිනැති අංක MOJ/L4/563/2023 දරන සංශෝධිත පනත් කෙටුම්පත සඳහා පළාත් කොමසාරිස්වරුන්ගේ නිර්දේශ ලබා දෙන ලෙසට දන්වා ඇත. මෙයට අමතරව ළමා පනත හා දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත සංශෝධනය සඳහා අධිකරණ අමාත්‍යාංශය මගින් කමිටුවක් පත් කර අවසන් කෙටුම්පත ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත භාර දීමට කමිටුවට නියෝග කර ඇති බව	ආඥා පනත් ඇතුළු නීති හා අණපනත් කාලීන අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.

4.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම අනුව පවුල් 500 ක් සඳහා නිවුන් දරු ආධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට එහි ප්‍රගතිය පවුල් 280 ක් එනම් සියයට 56 ක් පමණක් වී තිබුණි. එහි මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි 1.875 ක්වී තිබුණු අතර මූල්‍ය ප්‍රගතිය රු.මි 1.375 ක් වී තිබීම නිසා මූල්‍ය ප්‍රගතිය සියයට 73.3 ක් වී තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය අඩුවී මූල්‍ය ප්‍රගතිය වැඩිවී තිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම තුළ නිවුන් දරුවන් සඳහා ආධාර ලබා දීමට ප්‍රතිලාභීන් 500 ක් ඇතුළත් කර ඇත්තේ ඒ පිළිබඳ ලැබිය හැකි ඉල්ලීම් ප්‍රමාණය උපකල්පනය කිරීමෙනි. ඒ අනුව මෙම වර්ෂයේදී නිවුන් දරු ඉල්ලීම් ලැබී තිබුණේ 372 ක් පමණි. ඒ අනුව වර්ෂය තුළ ලැබුණු සියලු ඉල්ලීම්වලට අදාල ගෙවීම් සිදු කරන ලද බව.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වැඩසටහන් කාලීනව හා කාර්යක්ෂමව ඉටුකර අපේක්ෂිත භෞතික හා මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	පීඩාවට පත් ළමුන් සඳහා හදිසි විපත් ආධාර ලබා දීම සඳහා අපේක්ෂිත ව්‍යාපෘති නිමවුම දරුවන් 200 ක් වුවද ඒ සඳහා දරුවන් 85 ක් පමණක් හඳුනා ගෙන තිබුණි. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 42.5 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රගතිය සියයට 54 ක් වීම තුලින් භෞතික ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි.	හදිසි විපත් ඉල්ලීම් ලැබිය හැකි යැයි උපකල්පනය කල හැකි ඉල්ලීම් සංඛ්‍යාව 200 කි. නමුත් එවැනි ඉල්ලීම් ලැබුණේ 53ක් පමණි. ඒ අනුව ලද ඉල්ලීම් සඳහා අදාල ගෙවීම් සිදුකරන ලද බව.	- එම -

4.4 විදේශ ආධාර ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ධාරිතා සංවර්ධන වැඩසටහන**		
(i)	ජාතික ළමා සභාවේ ඉදිරි වසර සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම වැඩසටහනේ මූලික අරමුණක් වුවද විගණිත දින දක්වාම එම අරමුණ ඉටුකර නොතිබුණි.	දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, උපකාරක පන්ති, විභාගවලට සූදානම් වීම වැනි කරුණු නිසා ඔවුන්ට එය සංශෝධනය කිරීමට වැඩි කාලයක් අවශ්‍ය වන බව දැනුම් දෙන ලද බව.	ජාතික ළමා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම කාලීනව සකස් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.
(ii)	ළමුන් 60 දෙනෙකු සඳහා උක්ත වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, ළමුන් 41 දෙනෙකු පමණක් සහභාගී වී තිබූ අතර ළමුන් තෝරා ගැනීමේ	වැඩසටහනට සහභාගි කර ගැනීමට නියමිත දරුවන් 60 දෙනාම තම සහභාගිත්ත්වය තහවුරු කර තිබූ නමුත්, එවක පැවැති ධාරානිපාත වර්ෂාව නිසා පැමිණීම තහවුරු කළ	ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අපේක්ෂිත සහභාගීත්වය පවතින බවට

ක්‍රියාවලියද විනිවිදභාවයකින් තොර විය. මෙවැනි වැඩසටහන් සැලසුම් කිරීමේදී වැඩසටහනේ අපේක්ෂිත සහභාගීත්වය සපුරා ගැනීම කෙරෙහි අවධානය යොමුවී නොතිබූ අතර අපේක්ෂිත අරමුණ ඉටුවී තිබේදැයි මැන බැලීමට කාර්ය සාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි.	දරුවන්ගෙන් ඇතැමෙකු ඊට සහභාගී විය නොහැකි බව දැනුම් දෙන ලදී. ඒ අනුව වැඩසටහන් සැලසුම් කළ පරිදි සහභාගී වූ දරුවන් සමඟ පැවැත්වීමට සිදු වූ බව.	තහවුරු කර ගැනීමට හා අපේක්ෂිත අරමුණු ඉටුවන බවටත් කාර්යසාධන දර්ශක හඳුන්වාදීම මගින් තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) **යුනිසෙෆ් අරමුදල මගින් සිදුකළ ව්‍යාපෘතිය**		
(i) කාන්තා,ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය හරහා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට කෙටි කාලීන මූල්‍ය සහාය ලබාදීමේ ව්‍යාපෘතියක් ලෙස යුනිසෙෆ් ආයතනයෙන් 2024 වර්ෂය වෙනුවෙන් රු.මිලියන 27.7 ක ප්‍රදානයක් ලැබී තිබුණද 2024 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු වියදමක් දරා නොතිබුණි.	2024 වර්ෂයේ වෙන්කළ මුදල් වැය කිරීමට පෙර 2023 වසරේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඉතිරි වූ මුදල් වැය කළ යුතුව තිබුණි. ඒ අනුව 2023 වසරේ ඉතිරි මුදල වූ රු.මිලියන 14.349 සඳහා වැඩසටහන් සකස් කර අමාත්‍යාංශයේ ලේකම්ගේද අනුමැතිය සහිතව ක්‍රියාත්මක කරන ලදී. 2024 වර්ෂයේ අග භාගයේ මහ මැතිවරණය හා ජනාධිපතිවරණය පැවැත්වීම තුළ 2024 වර්ෂය සඳහා වෙන් කර තිබූ රුපියල් 27.7 ක මුදල වැය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම මත 2024 වර්ෂය සඳහා සැලසුම් කල කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ බව.	විදේශාධාර මඟින් ලැබෙන ප්‍රතිපාදනයන් ඵලදායීව ළමාආරක්ෂණ කටයුතු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ii) යුනිසෙෆ් ආයතනය විසින් 2023 වර්ෂයේ ලබාදුන් ආධාර වලින් රු.මිලියන 14.35 ක් ඉතිරිව පැවති අතර එම ප්‍රමාණයට එහි 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 12.1 ක් වියදම ලෙස වාර්තා කර තිබුණි. ඒ අනුව රු.මිලියන 2.23 ක් උපයෝජනය කර නොතිබුණි.	2023 වර්ෂයේ ඉතිරි වූ මුදලින් 2024 වර්ෂය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර මෙම වැඩසටහන් සඳහා සැලසුම් කළ වියදම් ඒ අයුරින්ම ඇතැම් වැඩසටහන් සඳහා දැරීමට සිදු නොවීම තුළ මුදල් ඉතිරි වූ බව.	- එම -
(iii) යුනිසෙෆ් අරමුදල ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, මූලික අවශ්‍යතා සපුරාලීම, ඔවුන්ගේ හැකියාවන් කරා ළඟාවීමට ඇති අවස්ථා පුළුල් කිරීම,දේශගුණික විපර්යාස සහ පරිසරය, මුල් ළමාවිය	2023 වර්ෂයේ යුනිසෙෆ් ආධාර වශයෙන් ලබා දුන් මුදලින් 2024 වර්ෂය සඳහා ඉතිරි වූ මුදල රුපියල් මිලියන 14.349 කි. මෙම මුදලින් වැඩසටහන් 07ක් ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා රු.12,541,268 ක් වියදම් විය. එම වැඩසටහන්වලින්	දරුවන් වෙනුවෙන් වූ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුවන ආකාරයට කටයුතු කළ යුතු වීම හා ප්‍රදානයෙන් වැඩි ප්‍රතිශතයක් දරුවන්

	සංවර්ධනය, අධ්‍යාපනය, ලිංගභේදය යන පුළුල් පරාසයක වූ ළමුන්ගේ අවශ්‍යතා අයිතීන් වෙනුවෙන් පිහිටුවා තිබුණද 2023 වර්ෂයේ ලබාදුන් ප්‍රදානයෙන් උපයෝජනය නොකළ රු.මිලියන 14.35 ක අරමුදල් ප්‍රදානයන් ක්‍රියාකාරකම් 05 ක් වෙනුවෙන් සැලසුම් සකස් කර තිබූ අතර ඉන් රු.මිලියන 11.4 ක්ම එනම් සියයට 80 ක් පමණ දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා යොදවා තිබුණි.	නිලධාරීන් සඳහා වැඩසටහන් 03 ක් ද, ළමුන් සඳහා වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලද බව.	වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතුය.

(ඇ) **ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලැබූ ආහාර සුරක්ෂිතතාව හා ජීවනෝපාය සංවර්ධන හදිසි ආධාර ව්‍යාපෘතිය**

(i)	ඉහත ව්‍යාපෘතිය යටතේ ලද මේස පරිගණක 100 ක් හා ලේසර් මුද්‍රණ යන්ත්‍ර 100 ක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙත ලබාදීම සඳහා පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත බෙදා දී තිබූ අතර ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙත එම උපකරණ බෙදා දුන් බවට වූ නිකුත් කිරීමේ නියෝග හා ලැබීම් නියෝග ලබාගෙන නොතිබුණි. එමෙන්ම එම උපකරණ ඊකවරණ මධ්‍යස්ථානවල ඉන්වෙන්ට්‍රි ලේඛන වලට ඇතුළත් කළ බවට තහවුරු කිරීමේ සාක්ෂි නොතිබුණි.	ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙත එම උපකරණ බෙදා දුන් බවට අදාල ලේඛන මේ වන විට දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති බව.	මුදල් රෙගුලාසි 752 අනුව ලැබීම් හා නිකුත් නියෝග ලබාගෙන ඉන්වෙන්ට්‍රි ලේඛණ වලට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	පරිගණක යන්ත්‍ර හා ලේසර් මුද්‍රණ යන්ත්‍ර 03 බැගින් වර්තමානය වන විටත් වසා දමා ඇති පරත්ත පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයට ලබාදී තිබීම හේතුවෙන් එම උපකරණ වල වගකීම් කාලය තුළ භාවිතා නොකර නිශ්ක්‍රීයව තබා තිබුණි.	පරත්ත පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය ඉදිරියේදී ආරම්භ කිරීමේ අරමුණින් අදාල පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර එම ආයතන වෙත වෙන්කර ඇතත් ගොඩනැගිල්ල නවීකරණය කිරීමෙන් තොරව දරුවන් බඳවා ගෙන පුහුණු කිරීම් සිදු කිරීම සඳහා සුදුසු තත්ත්වයක් නොපවතින බැවින් එම ආයතනය ක්‍රියාකාරී තත්ත්වයට පත්	සෑම වත්කමක්ම ඵලදායීව දෙපාර්තමේන්තුව විසින් යොදා ගනු ලබන බවට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඇ) වගන්තිය අනුව

		කරන තෙක් අදාල පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කරන බව.	සමාලෝචනය කර අවශ්‍ය ලිඛිත උපදෙස් නිකුත් කිරීමට ගණන් දීමේ නිලධාරී කටයුතු කළ යුතුය.
(ඇ)	ළමා ආරක්ෂණ සැලසුම් සඳහා මූලාධාර සැපයීම වෙනුවෙන් දරුවන් 300 ක් ඉලක්ක කර රු.මිලියන 29 ක් වෙන්කර තිබුණද රු.මිලියන 1.4 ක් ආරක්ෂණ සැලසුම් 15 ක් වෙනුවෙන් වැයකර තිබුණි. මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය සියයට 5 ක් තරම් වූ ඉතා අඩු මට්ටමක පැවතුණි.	ADB ව්‍යාපෘතිය යටතේ දරුවන් සඳහා ළමා ආරක්ෂණ සැලසුම ක්‍රියාත්මක කිරීමේදී සමෘද්ධි බැංකුව හරහා එම මුදල් ගිණුම්ගත කිරීමේ ක්‍රියාවලිය සිදු කළ යුතු වූ බැවින් එම ක්‍රියාවලියේ පවතින සංකීර්ණ බව හා දෙපාර්තමේන්තුමය නිලධාරී හිගය මත යම් යම් ප්‍රමාදයන් සිදු වී ඇති බව.	අපේක්ෂිත අයවැය ඉලක්ක කාලීනව සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අපයෝජනයට ලක්වන දරුවන්ට සහ විවිධ ගැටළු වලට මුහුණ දුන් ගැහැණු දරුවන්ට උපදේශනය ලබා දීම, ජීවන කුසලතා වර්ධනය, වෘත්තීය පුහුණුව ලබාදීම තුළින් සමාජගත කිරීම සඳහා පවතින පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය සහ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථාන දෙක 2021 මැයි 12 වන දින කොවිඩ් අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා පවරා දී තිබුණු අතර 2023 ජූනි 06 දින මෙම මධ්‍යස්ථාන දෙක විධිමත්ව නැවත දෙපාර්තමේන්තුවට පවරා ගනු ලැබුවද එහි භෞතික සම්පත් හා අවට පරිසරය යථා තත්වයට පත්කර පුහුණු හා උපදේශන සේවා සැපයීම සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2025 අයවැය සාකච්ඡාවට එම මධ්‍යස්ථානය නවීකරණය සඳහා රු.මිලියන 28 ක පමණ මුදලක් ඉල්ලීම් කර ඇත. කෙසේ වෙතත් ඒ සඳහා මුදල් ප්‍රතිපාදනය වී නොමැති බැවින් අදාල නවීකරණ කටයුතු සිදු කර එම මධ්‍යස්ථානය භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට පත් කර ගැනීමට අපහසු වී ඇති බව.	සෑම වත්කමක්ම ඵලදායීව දෙපාර්තමේන්තුව විසින් යොදා ගනු ලබන බවට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඇ) වගන්තිය අනුව සමාලෝචනය කර අවශ්‍ය ලිඛිත උපදෙස් නිකුත් කිරීමට ගණන් දීමේ නිලධාරී කටයුතු කළ යුතුය.

(ආ)	දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ, නිලධාරීන් 60 දෙනෙකුට පමණ පුහුණු වීම් සිදුකළ හැකි වායු සමීකරණය කළ සියළුම පහසුකම් සහිත දේශන ශාලා දෙකක් පැවතුණද එම සම්පත් නිශ්කාර්යව පැවතුණි.	2025 අයවැය සාකච්ඡාවට එම මධ්‍යස්ථානය නවීකරණය සඳහා රු.මිලියන 28 ක පමණ මුදලක් ඉල්ලීම් කර ඇතත් ඒ සඳහා මුදල් ප්‍රතිපාදනය වී නොමැති බැවින් අදාල නවීකරණ කටයුතු සිදු කර මධ්‍යස්ථානය භාවිතයට ගැනීමට සුදුසු තත්ත්වයට පත් කර ගැනීමට අපහසු වී ඇත. ඉදිරියේදී මේ පිළිබඳ ව්‍යාපෘති වාර්තාවක් සකස් කර බාහිර මූලාශ්‍ර ඔස්සේ නවීකරණ කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන ලබාගෙන නවීකරණය කර මධ්‍යස්ථානය නියමිත කටයුතු සඳහා යොදා ගනු ඇති බව.	අළුත්වැඩියා කටයුතු කඩිනමින් සිදුකර මධ්‍යස්ථානය පුහුණු කටයුතු සඳහා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	උපදේශන ගාස්තුද ඇතුළත්ව රු.මිලියන 2.3 ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී කාලීන හා නිවැරදි දත්ත ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNRC දත්ත පද්ධතියට වසර 06 ක් ඉක්ම ගියද අදාළ අවශ්‍යතාවට යොදා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාකර නොතිබුණි.	වසර 5 කට වරක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා ආරක්ෂක කමිටුව වෙත ඉදිරිපත් කල යුතු වාර්තාව සැකසීම ළමුන් වෙනුවෙන් සෘජුව හා වක්‍රව කටයුතු කරන අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ආයතන කිහිපයක සහයෝගය ඇතිව දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයක් ලෙස UNCRC දත්ත පද්ධතිය 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට ලබාදී ඇතත් තාක්ෂණික ගැටළු හේතුවෙන් භාවිතයට ගත නොහැකි වී ඇත. මෙම පද්ධතිය නවීකරණය කර, වඩාත්ම සුරක්ෂිත සහ කාර්යක්ෂම ලෙස ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙතින් ලබා ගැනීමට ඉල්ලීමක් සිදු කර ඇති බව.	කාලීන හා නිවැරදි දත්ත රැස්කිරීම සඳහා දත්ත පද්ධතිය යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

4.6 කළමනාකරණ දුර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1992 අංක 15 දරණ ළමයින් දරුකමට හදාවඩා ගැනීමේ (සංශෝධන) පනතේ 10 (ඇ) වගන්තියෙහි අ, ආ,ඇ ඡේද මගින් දක්වා ඇති පරිදි හදාවඩා ගැනීම සඳහා ලබාදුන් දරුවන් පිළිබඳව අවුරුදු 10 ක් යනතෙක් පසුවිපරම් වාර්තා ලබාගත යුතු වුවද, එම	පවුලේ ඥාති දරුවන් හදා වඩා ගත් දෙමාපියන් විසින් ප්‍රගති වාර්තා එවීමේදී නිසි පරිදි ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකරන අවස්ථා ඇත. ඉදිරියේදී මෙම ප්‍රගති වාර්තා නිසි පරිදි ලබා ගැනීමට නව වැඩපිළිවෙළක් සකස්කොට ඇති බව.	ආඥා පනතට අනුකූලව පසුවිපරම් වාර්තා ලබාගත යුතු අතර විදේශීය හදාවඩා ගැනීම් සඳහා ලබාදෙන දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය.

	පසුවිපරම් වාර්තා නිසි පරිදි අඛණ්ඩව ලබා නොගැනීම හේතුවෙන් එම දරුවන් අනාරක්ෂිත වී තිබුණි.		
(ආ)	ශ්‍රී ලංකාව 1994 වර්ෂයේදී රටවල් අතර ළමයින් දරුකමට හදාවඩා ගැනීම සම්බන්ධ සහයෝගීතාව සහ එම ළමුන් ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රඥප්තිය (හේග් සම්මුතිය) අනුමත කර තිබූ අතර එහි 18 වැනි වගන්තිය අනුව දරුවන් හදාවඩා ගැනීමට රටවල් දෙකෙහිම අනුමැතිය ලබාගත යුතු අතර 17 වැනි වගන්තිය අනුව දරුවා ලබාදුන් රටෙහි මධ්‍යම අධිකාරිය විසින් දරුවා හදා වඩාගැනීමට ලබාගත් රටේ නීතියට අනුව මෙම කාර්යය සඳහා එකඟ වන බවට සහතකියක් ලබාගත යුතු වුවද එම කාර්යය නියමිත පරිදි සිදු කර නොතිබුණි.	හේග් සම්මුතියට අත්සන් තබා ඇති සෑම රාජ්‍යයකින්ම 18 වගන්තිය යටතේ අනුමැතිය ලබාගෙන ඇති බව.	හේග් සම්මුතියේ 17 වගන්තිය අනුව අදාල එකඟතා සහතිකයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර 2014 අගෝස්තු මාසයේ සිට වසර 10 ක කාල සීමාවක් ද, පරිවාස නිලධාරී තනතුර 2017 වර්ෂයේ සිට වසර 07 ක කාලයක් ද පුරප්පාඩුව පැවතුණි.	දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට අදාල ගැසට් නිවේදනයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති නමුත් නිවේදනයේ යෙදුම් කිහිපයක දෝෂ පැවතීම මත එය සංශෝධනය සඳහා නැවත එම සේවා කොමිසම වෙත යොමු කර ඇති බව.	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අත්‍යාවශ්‍ය වන තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවීමට හෝ අවශ්‍ය පරිදි අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.